**ශීර්ෂය 233 – රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2017 වර්ෂය**

---

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම, සැසඳුම් ප්‍රකාශය, ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව විසින් විගණනයට ඉදිරිපත් කරන ලදී. එම ගිණුමෙන් හා සැසඳුම් ප්‍රකාශයෙන් නිරූපනය වන මූල්‍ය හා භෞතික කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සාමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදී.

**1.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම**

---

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයිම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරිම මෙන්ම රජයේ සියළුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු අවේක්ෂණයද මුදල් අමාත්‍යවරයා වෙත පැවැරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත් කර ඇත. මුදල් රෙගුලාසි 125(1)(අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියළු මුදල් ගනුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරීයා වන අතර ආදායම් ගණන්දීමේ නිලධාරියා භාණ්ඩාගාරය විසින් පත්කර ඇත. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටු කර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.3 විගණන විෂය පථය

ශිර්ෂය 233 - රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් සැලැසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනිම, නීති, රීති හා රෙගුලාසිවලට අනුකූලවීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරිම, කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාළ පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2018 ඔක්තෝබර් 12 දින රජයේ රස පරීක්ෂක වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනිම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලැසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරිම් මත පදනම් වි ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.4 විගණන නිරීක්ෂණය

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා දෙපාර්තමේන්තුවේ සිදු කරන ලද විගණනයේදී අනාවරණය වු විගණන නිරීක්ෂණ ඉහත 1.3 ඡේදයේ සඳහන් කර ඇති කළමනාකරණ විගණන වාර්තාවේ විස්තරාත්මකව දක්වා ඇත. එම නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.1 ඡේදයේ සිට 2.12 දක්වා ඡේදවල සඳහන් කර ඇත. මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 128 හි සඳහන් විධිවිධාන ඉටු කිරීමේදී අනාවරණය වූ පහත සඳහන් සටහනේ සාරාංශගත කර දක්වා ඇති විගණන නිරීක්ෂණවලට යටත්ව ගණන්දීමේ නිලධාරී වශයෙන් තම ගිණුම් කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටු තිබුණු බව නිරීක්ෂණය විය

| මුදල් රෙගුලාසි 128(1) ප්‍රකාර ගණන්දීමේ නිලධාරීගේ ගිණුම් කටයුතුභාවය | | ගණන්දීමේ නිලධාරි එම විධිවිධානයට අනුගත වී නොතිබීම | නිරීක්ෂණය ඇතුළත් වාර්තාවේ ඡේද යොමුව |
|---|---|---|---|
| මුදල් රෙගුලාසි | | | |
| 128(1)(අ) | රජය විසින් නියමකර දක්වා ඇති ප්‍රතිපත්තිය හා බලය දෙනු ලැබූ කටයුතු සඳහා මූල්‍ය ප්‍රතිපාදන සලසා දී මෙහිලා පාර්ලිමේන්තුවේ අභියෝගයන් ගැන සැලැකිල්ලට ගෙන තම දෙපාර්තමේන්තුවේ කටයුතු විචක්ෂණ භාවයෙන් යුක්තව සැලැසුම් කර ක්‍රියාත්මක කරන බව සහ ප්‍රස්තුත වර්ෂය සඳහා නියමිත වැඩසටහන සම්පූර්ණ කිරීමට සහ/හෝ නියමිත ඉලක්කය සාක්ෂාත් කර ගැනිමට පරිශ්‍රමයක් දක්වා තිබිම | අයවැය ඇස්තමේන්තු තාත්ත්වික ලෙස පිළියෙල නොකිරිම | 2.4 |
| 128(1)(ඇ) | මුදල් රෙගුලාසි හා රජයේ වෙනත් පරිපූරක නියමයන් තම දෙපාර්තමේන්තුවේදී පිළිපදිනු ලබන බවට හා අවශ්‍ය අවස්ථාවලදී ඒවාට අතිරේක වශයෙන් දෙපාර්තමේන්තු නියමයන් නිකුත් කරන බව | 1. ලේඛන හා පොත්පත් පවත්වා නොතිබිම | 2.6 |
| | | 2. අනුකූල නොවිම් | 2.7 |

| | | | |
|---|---|---|---|
| 128(1)(ඉ) | රජය සතු වු හෝ රජයේ භාරයේ පවත්නා මුදල් බඩුබාහිර උපකරණ හා වෙනත් වත්කම් සුරක්ෂිතව තබා ගැනීම සහ සංරක්ෂණය සඳහා ප්‍රමාණවත් තරම් සහ විධිමත් විධිවිධාන යොදවනු ලබන බව, ඒවා වරින්වර සත්‍යාපනය කරනු ලබන බවටත්, ඒවා නිසියාකාරව නිෂ්කාශණය කරනු ලබන කල්හි එසේ නිෂ්කාශණය කිරීම නියමිත රෙගුලාසිවලට හා උපදෙස්වලට අනුකූලව කරනු ලබන බව | වත්කම් කළමනාකරණයේ අඩුපාඩු | 2.3 |
| 128(1)(ඊ) | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා හෝ භාණ්ඩාගාරය හෝ විසින් ඉල්ලා සිටින තොරතුරු, ප්‍රකාශ හා වාර්තා නිවැරදිව කලට වේලාවට ඉදිරිපත් කරන බව | වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළියෙල නොකිරීම | 2.1 (ආ) |
| 128(1)(උ) | හිඟව තිබෙන ගාස්තු යනාදිය අයකර ගැනිමට විශේෂ විධිවිධාන යොදන බවට සහ එම කාර්ය පැවරී ඇති නිලධාරීන් විසින් හිඟ මුදල් පිළිබඳව ඒවා අයකර ගැනීම කඩිනම් කිරීමට ගනු ලැබූ පියවර පිළිබඳව යටත් පිරිසෙන් තුන් මාසයකට වරක් හෝ අන්‍යාකාරයකින් විධානය කළ පරිදි හෝ තමා වෙත වාරතා කරන බව, | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ හිඟහිටි ණය ශේෂ අය කර ගැනීම | 2.5 |
| 128(1)(ග) | ඇප තැබීමට බැඳී සිටින නිලධාරීන් එවකට වලංගු නීතිය හා නියමයන් අනුව ඇප තබන බව | අදාළ නිලධාරීන්ගෙන් ඇප ලබා ගැනීමේ අඩුපාඩු | 2.12 |

| | | | |
|---|---|---|---|
| 128(1)(ජ) | නිලධාරීන්ගේ/සේවකයින්ගේ ප්‍රමාදය, නොසැලැකිල්ල, වරද හෝ වංචාව නිසා රජයට පාඩු සිදු වී ඇති අවස්ථාවලදී මුදල් රෙගුලාසි 103 සිට 108 දක්වා රෙගුලාසිවල නියම කර ඇති කාර්ය පරිපාටිය ගණන්දීමේ නිලධාරීන් විසින් අනුගමනය කරනු ලබන බවටද, මුදල් රෙගුලාසි 156(1) අනුව එම පාඩු සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්/සේවකයන් මත අධිභාර පනවනු ලබන බව (වගබලා ගැනීම පිණිස ප්‍රමාණවත් විධිවිධාන යෙදීම විශේෂයෙන් ඔහුගේ යුතුකම් භාරය වන්නේය.) | පාඩු හා හානි | 2.3 |

## 2. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 2.1 කාර්යසාධනය

**කාර්යයන් ඉටුකිරීමේ ප්‍රමාදයන්**

(අ) අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ 2017 වාර්ෂික කාර්යසාධන වාර්තාව අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් ඉටු කිරීමේ ප්‍රගතිය පහත දැක්වේ.

| අංශය | 2017.01.01 දින ඉතිරි නඩු සංඛ්‍යාව | සමාලෝචිත වර්ෂය තුළ ලැබී ඇති නඩු සංඛ්‍යාව | සමාලෝචිත වර්ෂය තුළ වාර්තා කළ නඩු සංඛ්‍යාව | 2017.12.31 දිනට වාර්තා නොකළ නඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| මත්ද්‍රව්‍ය සහ මනෝ වර්තක | 1,210 | 10,782 | 10,508 | 1,484 |
| ගිනි අවි සහ ප්‍රක්ෂිප්ත විද්‍යා | 392 | 380 | 492 | 280 |
| පුපුරණ ද්‍රව්‍ය හා ගිනි ගැනීම් | 195 | 422 | 464 | 153 |
| අධිකර ධූලක විද්‍යා අංශය (විෂ වර්ග) | 1,033 | 2,469 | 2,196 | 1,306 |
| අධිකරණ මස්තු විද්‍යා අංශ | 1,577 | 1,602 | 1,180 | 1,999 |
| සැක කටයුතු ලේඛන අංශය | 301 | 887 | 721 | 467 |
| පරිගණක අපරාධ | - | 467 | 256 | 211 |
| අධිකරණ විද්‍යා විවිධ අංශය | 149 | 453 | 398 | 204 |
| ප්‍රධාන කාර්යාලය ( මත්පැන් ) | 50 | 2,152 | 2,182 | 20 |
| මධ්‍යසාර හා දුම්කොළ | 03 | 2,214 | 2,188 | 29 |
| කුරුණෑගල ( මත්පැන් ) | 0 | 2,191 | 2,191 | 0 |
| ආහාර පනත යටතේ ආහාර සාම්පල | 31 | 6,766 | 6,784 | 13 |
| විවිධ ආහාර වර්ග | 03 | 1,603 | 1,604 | 02 |
| **එකතුව** | **4,944** | **32,388** | **31,164** | **6,168** |

සමාලෝචිත වර්ෂයට අවසානයට වාර්තා ඉදිරිපත් නොකළ නඩු සංඛ්‍යාව 6,168 ක් වූ අතර ඉන් වර්ෂ 10 කට වැඩි කාලයක් ගතවූ නඩු 21 ක් ද වර්ෂ 05 – 10 ත් අතර කාලයක් ගතවූ නඩු 310 ක් ද විය. එසේම වර්ෂ 1 සිට 5 දක්වා කාලයක් ගතවී තිබූ නඩු 1190 ක් වූ අතර වර්ෂ 1 ට වඩා අඩු කාලයක සිට පැවති නඩු 4647 ක් විය.

(ආ) කාර්යසාධන වාර්තාව 2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව දෙපාර්තමේන්තු විසින් මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත සමාලෝචිත වර්ෂයට අදාළ කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළයුතු වුවත් එම වාර්තාව 2018 ඔක්තෝබර් 05 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

## 2.2. වත්කම් කළමනාකරණය

-----------------------------

දෙපාර්තමේන්තුවේ වත්කම් සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

(අ) 2017 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදු කර, වාර්තාව 2018 මාර්තු 14 දින විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණද එම වාර්තාව 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.1 ඡේදය ප්‍රකාරව ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව සතු මෝටර් රථයක් 2015 ජූනි 28 දින දෙපාර්තමේන්තුව වෙත භාරදී තිබුණු අතර ඉන්වෙන්ට්‍රි ලේඛනයේ ඇතුළත් කර තිබුණි. එහෙත් වාහනය ලියාපදිංචි කිරීමේ සහතිකය අනුව 2011 නොවැම්බර් 23 දින ලංකා බැංකුවෙන් ලබාගත් ණය මුදලක් පවතින බැවින් මෙම රථය නීත්‍යානුකූලව පවරා ගැනීමක් සිදු කර නොතිබුණි.

## 2.3 පාඩු හා හානි

----------------

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ පාඩු හා හානි පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) 2003 පෙබරවාරි 14 දින රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව ගිනි ගැනීමෙන් සිදු වූ අලාභය රු.2,229,111 ක් ලෙස විසර්ජන ගිණුමේ DGSA–7 ආකෘතියේ, තවදුරටත් අය කර ගැනීමට හෝ කපා හැරීමට හෝ අත් හැරීමට ඇති පාඩු පිළිබඳ ප්‍රකාශය යටතේ දන්වා තිබුණි. මෙම ගිනි ගැනීම සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් සිදු කරන පරීක්ෂණ සඳහා මුදල් රෙගුලාසි 104(4) යටතේ වූ අලාභයක් පිළිබඳව නිවැරදි වාර්තාවක් 2009 දෙසැම්බර් 15 දිනට පෙර ලබාදෙන මෙන් අධ්‍යක්ෂ/ අපරාධ පරීක්ෂකගේ 2009 දෙසැම්බර් 03 දිනැති ලිපිය මඟින් දන්වා තිබුණ අතර ඒ අනුව කටයුතු කළ බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය.

මේ අනුව වසර 15 කට අධික කාලයක් ගත වී ඇතත් මෙම අලාභයක් අය කර ගැනීමට/ කපා හැරීමට/ අත් හැරීමට කටයුතු කර නොමැති බව විගණනයේදී නිරීක්ෂණය විය.

## 2.4 කාර්යභාරයන් ඉටු කිරිම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය උපයෝජනය කිරිම

---

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂ 05 ක කාලය තුළ දෙපාර්තමේන්තුවට සලසා තිබුණු ප්‍රතිපාදනය, උපයෝජනය හා ඉතිරිය පිළිබඳ තොරතුරු හා ඒ පිළිබඳ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| **වර්ෂය** | **වියදම් වර්ගය** | **ශුද්ධ ප්‍රතිපාදනය** | **උපයෝජනය** | **ඉතිරිය** | **ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|---|
| | | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | |
| 2013 | පුනරාවර්තන | 135.36 | 134.03 | 1.33 | 1 |
| | මූලධන | 237.19 | 201.54 | 35.65 | 15 |
| | **එකතුව** | 372.55 | 335.57 | 36.98 | 10 |
| 2014 | පුනරාවර්තන | 182.81 | 174.37 | 8.44 | 5 |
| | මූලධන | 118.67 | 87.48 | 31.18 | 26 |
| | **එකතුව** | 301.48 | 261.85 | 39.62 | 13 |
| 2015 | පුනරාවර්තන | 224.80 | 210.06 | 14.74 | 7 |
| | මූලධන | 290.50 | 162.62 | 127.88 | 44 |
| | **එකතුව** | 515.30 | 372.68 | 142.62 | 28 |
| 2016 | පුනරාවර්තන | 248.25 | 244.65 | 3.60 | 1 |
| | මූලධන | 412.25 | 365.69 | 46.55 | 11 |
| | **එකතුව** | **660.50** | **610.34** | **50.15** | **8** |
| 2017 | පුනරාවර්තන | 267.22 | 250.81 | 16.41 | 6 |
| | මූලධන | 108.26 | 103.08 | 5.17 | 5 |
| | **එකතුව** | **375.48** | **353.89** | **21.58** | **6** |

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

මුදල් රෙගුලාසි 94(2) අනුව වාර්ෂිකව පුනරාවර්තනය වන සේවාවන් හෝ සැපයුම් යටතට අයත් නොවන පුනරාවර්තන වැය විෂයයන් එකක හා මූලධන වැය විෂයයන් දෙකක ප්‍රතිපාදන ඉක්මවා රු.7,153,867 ක බැරකම් සඳහා බැඳී තිබුණි.

## 2.5 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

දෙපාර්තමේන්තුවට අදාල විෂය අංක 23301 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ .

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 8.00 | 7.33 | 5.50 | 5.89 | 35.00 | 19.54 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

**හිඟ හිටි ණය ශේෂ අයකර නොගැනීම**

විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව 2017 දෙසැම්බර් 31 දිනට අයවීම් හිඟහිට තිබුණු 2007 වර්ෂයේදී වැඩ තහනමට ලක් වූ නිලධාරිනියකගෙන් අයවිය යුතු රු.18,754 ක ආපදා ණය ශේෂය වර්ෂ 10 කට වැඩි කාලයක් ගත වී තිබුණද අයකර ගෙන නොතිබුණි.

## 2.6 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

හානි පිළිබඳ ලේඛනය මුදල් රෙගුලාසි 110 හි විධි විධාන ප්‍රකාරව යාවත්කාලීන කර නොතිබුණි.

## 2.7 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

2004 ජනවාරි 26 දිනැති ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ උපදේශක චක්‍රලේඛ අංක 2004/ප්‍රස/01 චක්‍රලේඛයේ 3.1 ඡේදය ප්‍රකාරව 2015 හා 2016 වර්ෂවල වාර්ෂික තොග සමීක්ෂණය විගණන දිනය වූ 2017 දෙසැම්බර් 14 දින වන විටත් සිදුකර නොතිබුණි. 2014 වර්ෂයේ පුස්තකාල පොත් සමීක්ෂණ වාර්තාව 2016 මැයි 23 දින ඉදිරිපත් කර තිබුණ අතර, ඒ අනුව අබලන් වී ඉවත් කළයුතු පොත් 831 ක් හා අළුත්වැඩියා කළහැකි පොත් 37 ක් හඳුනාගෙන ඇති නමුත් විගණන දිනය වූ 2017 දෙසැම්බර් 14 දින වන විටත් ඒ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියා මාර්ගයක් ගෙන නොතිබුණි.

## 2.8 අභ්‍යන්තර විගණනය

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් එවන ලද අංක DMS/1103/VII හා 2016 සැප්තැම්බර් 01 දිනැති ලිපියට අනුව දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කිරීම සඳහා ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ III/ II ශ්‍රේණියේ අභ්‍යන්තර විගණක තනතුරක් අනුමත කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම තනතුර පුරප්පාඩුව පැවති අතර දෙපාර්තමේන්තුව තුළ අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණි.

## 2.9 විගණන හා කළමනාකරණ කමිටුව

දෙපාර්තමේන්තුව සඳහා අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය යටතේ විගණන හා කළමනාකරණ කමිටු ස්ථාපිත කර තිබුණි. 2016 ජනවාරි 28 දිනැති අංක DMA/2009/(1)(i) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය ප්‍රකාරව කාර්තුවකට අවම වශයෙන් එක් රැස්වීම බැගින් රැස්වීම් 04 ක් පැවැත්විය යුතු වුවද, සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පළමු කාර්තුව සඳහා 2017 සැප්තැම්බර් 13 දිනද දෙවන වන කාර්තුව සඳහා 2017 නොවැම්බර් 28 දිනද වශයෙන් රැස්වීම් 02 ක් පමණක් පවත්වා තිබුණි.

## 2.10 මානව සම්පත් කළමනාකරණය

### 2.10.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම

2017 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය, පුරප්පාඩු කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් දෙපාර්තමේන්තුව විසින් පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රු.මිලියන 130.84 ක් වැය කර තිබුණි.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| | ---------------- | --------- | --------- | --------- |
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 101 | 82 | 19 |
| (ii) | තෘතියික මට්ටම | 10 | 01 | 09 |
| (iii) | ද්විතියික මට්ටම | 118 | 80 | 38 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 78 | 68 | 10 |
| | | -------- | -------- | -------- |
| | **එකතුව** | **307** | **231** | **76** |
| | | ===== | ===== | ===== |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

පුරප්පාඩු අතුරින් පහත සඳහන් තනතුරුවල පුරප්පාඩු 28 පැවතීම ආයතනයේ කාර්යසාධනයට සෘජුවම බලපා තිබුණි.

| තනතුර | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| ----------- | --------- | --------- | --------- |
| රජයේ අතිරේක රස පරීක්ෂක (විශේෂ පන්තිය) | 02 | - | 02 |
| රජයේ නියෝජ්‍ය රස පරීක්ෂක | 05 | 02 | 03 |
| ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක | 76 | 65 | 11 |
| තත්ත්ව ආරක්ෂණ විද්‍යාඥ | 01 | - | 01 |
| රසායනාගාර සහකාර සේවය (අධි පන්තිය ) | 05 | 01 | 04 |
| රසායනාගාර උප සහකාර | 12 | 05 | 07 |
| | -------- | --------- | -------- |
| | **101** | **73** | **28** |
| | ===== | ===== | ===== |

මෙම දෙපාර්තමේන්තුව තුළ අංශ 13 යටතේ විද්‍යාත්මක පරීක්ෂණ සිදු කරනු ලබන අතර, ඒවායින් වාර්ෂිකව නිර්දේශ හා වාර්තා 30000 කට ආසන්න ප්‍රමාණයක් විවිධ ආයතනවලට ලබා දී තිබුණි. මෙම වාර්තා යතුරු ලියනය කර ගැනීම සඳහා එම වාර්තා ඉහළ ප්‍රමිතියකින් යුක්තව ඉදිරිපත් කිරීමට තාක්ෂණ සහකාර තනතුරු 09 ක සහ රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ තනතුරු 19 ක පුරප්පාඩු ඍජුවම බලපා තිබුණි.

## 2.11 **කාර්ය මණ්ඩල පුහුණු කිරීම**

සමාලෝචිත වර්ෂය අවසානයට දෙපාර්තමේන්තුවේ තත්‍ය කාර්ය මණ්ඩලය 231 ක් වූ අතර ඉන් දේශීය පුහුණු වීම් ලැබූ කාර්ය මණ්ඩලය 46 ක් ද විදේශීය පුහුණු වීම් ලැබූ කාර්ය මණ්ඩලය 05 ක්ද දේශීය හා විදේශීය පුහුණු වීම් ලැබූ කාර්ය මණ්ඩලය 04 ක්ද විය. ඒ අනුව දෙපාර්තමේන්තුවේ 231 ක් වූ තත්‍ය කාර්ය මණ්ඩලයෙන් දේශීය හෝ විදේශීය පුහුණුව ලැබූ කාර්ය මණ්ඩලය 51 ක් පමණක් වූ අතර නිලධාරීන් 180 දෙනෙකු කිසිම ආකාරයේ පුහුණුවක් ලබා නොතිබුණි.

## **2.12 රජයේ නිලධාරීන් ඇප තැබීම**

මුදල් රෙගුලාසි 880 සඳහන් විධිවිධාන ප්‍රකාරව රජයේ මුදල්, ආදායම් මුද්දර හෝ බඩු බාහිරාදිය භාර ගැනීම හෝ භාරව සිටීම, එසේ නැතහොත් රජයේ මුදල් බෙදා හැරීම හෝ මුද්දර නැතහොත් බඩු බාහිරාදිය නිකුත් කිරීම සම්බන්ධයෙන් පරිපාලනමය වශයෙන් වගකිව යුතු හෝ බලය පැවරීම යටතේ එම කටයුතු පවරනු ලැබ ඇති හෝ නිලධාරීන්ද රජයේ ගිණුමට අදාල වවුචර් සහතික කරන චෙක්පත් අත්සන් කරන අයද ස්වකීය රාජකාරි කටයුතු අවංකව ඉටු කරන බවට 612 වැනි අධිකාරය රජයේ නිලධාරීන්ගේ ඇප ආඥා පනතට අනුකූලව ඇප තැබිය යුතු වුවද, ඇප තැබිය යුතු නිලධාරීන් දහතුන් දෙනකු (13) සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව විසින් ඒ අනුව කටයුතු කර නොතිබුණි.